# නිසල අරණ

කුඩා කල පටන් ඉතා බෞද්ධ පරිසරයක හැදී වැඩුනු මම ජීවිතයේ එක්තරා අවදියකදී නිතරම පාහේ කොළඹ පිහිටි සම්බෝධි විහාරයේ පවත්වාගෙන යනු ලැබූ භාවනා පන්ති වලට සහභාගි වුනෙමු. බුද්ධ ධර්මයේ ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව කෙරේ කවදත් උනන්දුවක් ඇති මම එම භාවනා තුලින් බුදුරජාණන් වහන්සේ දේශනා කළ බොහෝ දෑ පිළිබඳව යම්කිසි අවබෝධයක් ලබා ගැනීමට සමත් වුනෙමි. එමෙන්ම එයින් ලබා ගත් දැනුම ප්‍රායෝගිකව පුරුදු පුහුනු කිරීමට නිරතුරුවම උත්සහ ගතිමි. මේ විස්මිත ධර්මය අත්විඳින බොහෝ අවස්ථාවලදී මා බුදුන් වහන්සේ දැකගතිමි. පොත්පත් වල ලියා ඇති පරිදි උන්වහන්සේ දැකගැනීමට අප කල්ප ගානක් පෙරුම් පිරීමට අවශ්‍ය නැති බවත් බුද්ධ ධර්මය ප්‍රයෝගිකව ගැනීමෙන් මේ ජීවිතයේදී ම අපට උන්වහන්සේ දැකගැනීමට හැකි බවත් පසක් කරගතිමි.

මේ දහම් මගේ ගමන් කරනා විට අපට නිවැරදි මග පෙන්වීමක් අවශ්‍ය වන්නේය. ඒ හා සමානවම වීර්යයක්, උනන්දුවක්, කැපවීමක් අත්‍යාවශ්‍යම දෙයක් වන්නේය. මේ කරුනු කාරනා සම්පූර්න වන විට බුදු දහමෙන් අප සැම බලාපොරොත්තු වන සතුට, සැනසීම මෙන්ම නිරාමිශ සුවය අත්විඳීමට හැකි වන්නේය. මේ ජීවිතයේ නොයෙක් විට අපට හමුවන බාදක, කම්කටොලු හමුවේ නොසැලෙමින් මැදහත් මනසකින් යුතුව ගමන් කිරීමට හැකි වන්නේය.

ඉතින් බුදු දහම විරල බටහිර සමාජයක ජීවත් වන අපට ගරු බොධිචිත්තා මෙහෙනින් වහන්සේ සංඝමිත්තාවකි. උන් වහන්සේ වැඩ සිටිනා 'නිසල අරන' භාවනා මධ්‍යස්ථානය ධර්මය ප්‍රගුන කිරීමට අවශ්‍ය නිසංසල වටපිටාවක්සහිත ආරන්‍යයකි. මෙවන්කෙනෙක්, මෙවන් තැනක් ලැබූ අපි වාසනාවන්තයෝ වෙමු. ගරු බොධිචිත්තා මෙහෙනින් වහන්සේ වචනයේ පරිසමාප්තියෙන්ම උගත් බුද්ධිමත් මෙහෙනින් වහන්සේ කෙනෙකි. ඉතා උගත් දෙමව්පිය දෙපලකට දාව උපන් එකම දරුවා වූ උන්වහන්සේ කුඩා කල පටන් ධර්මයට නැඹුරු ජීවිතයක් ගත කලාය. ඉගෙනීමට ඉතා දක්ෂ වූ අතර ඉතා ප්‍රසිද්ධ ගුරුවරුන් යටතේ ධර්මය හදාරා භාවනා දැනුම දියුනු කරගත්තාය. ඉගෙනීම දියුනු කර උපාධියක් ද ලැබූ අප මෙහෙනින් වහන්සේ මීට අවුරුදු කිහිපයකට පෙර වෙසක් පුර පසලොස්වක දින බුද්ධගයාවේදී සසුන් ගත වූවාය. එතැන් පටන් නිසල අරන භාවනා මධ්‍යස්ථානයේ වැඩසිටිමින් ඉතා විශාල සේවයක් සලසන උන්වහන්සේ අප සැමදෙනාටම මහත් ආශිර්වාදයක්ම වන්නේය.

නිසල අරන භාවනා මධ්‍යස්ථානය මෙල්බන් නුවර වාසය කරන අප සැමදෙනාටම ලෞකික සහ ආධ්‍යාත්මික සැනසීම ලබාදෙන ස්ථානයකි.







ඩැංඩිනොං වැනි කලබලකාරී නගරයක මෙය පිහිටා තිබුනද වටාපිටාව ඉතා සංසලය. නොයෙක් තුරු ලතාවලින් සහ බටපඳුරු වලින් ගැවසීගත් උයන් සිතටත් ........ දක්වන්නේ සන්සුන් බවකි. තැනින් තැන තබා ඇති බුදුපිළිම බවුන් වැඩීම සඳහා අප දිරිමත් කරයි. සුදු පැහැති ගල් ඇතිරූ බිම උයනට ගෙන එන්නේ මහත් ....... එලියකි. අතරින් පතර තබා ඇති නොඋස් අසුන් ඇත්තේ කැමති පරිදි පරිසරයේ සුවය විඳිමින් භාවනා කිරීම සඳහාය. උයන් කොනේ වැඩ සිටිනා සැතපෙන පිලිමය දුටුවිට කිව නොහැකි තරම් බැතියකින් සිත පිරී යයි. ඉන් දකුනත බැලූ විට සරුවට වැඩුනු දෙලුම් ගස් යට මදහසින් මුව සරසා භාවනා සුවයෙන් සිටින තවත් බුදු පිලිමයකි. රත්පැහැ දෙළුම් ගෙඩි විදුලි බුබුළු මෙන් පරිසරයේ අලංකාරය දෙගුන තෙගුන කරයි. මේ සැමදෙයකින්ම සිතට දැනෙන්නේ සන්සුන් කමකි. නිවුනු බවකි.

මෙහි සෑම සතිඅන්තයකම වැඩිහිටියන් සහ ලමුන් සඳහා භාවනා පන්ති පවත්වන අතර දරුවන් සඳහා දහම් පාසැලක්ද තරුන ලමුන් සඳහා youth group එකක් ද පවත්වයි. මෙයට නොයෙක් ජාතික අය සහභාගි වන අතර සතියේ දිනවලද පැමින භාවනා කරන පිරිස දිනෙන් දින ඉහල යමින් පවති. ජීවිතයේ අප සැමදෙනාටම මුහුන දෙන්නට වන බාදක ගැටළු හමුවේ අත්විඳින්නට සිදුවන මානසික පීඩනයක් මත උන්වහන්සේ හමුවට එන සෑම දෙනාටම ජාති, ආගම් සහ වර්න භේදයකින් තොරව ඉතා කරුණාවෙන් කතාබස් කොට සහනදායී ජීවිතයක් ගත කිරීමට උගන්වා දෙන අන්දම ඇත්තෙන්ම පැසසුම් සහගතය.

නිසල අරන භාවනා මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන දහම්පාසැල් දරු දැරියන් විසින් පසුගිය ජූනිමස 27 වෙනිදා පොසොන් උත්සවය අති උත්කර්ශවත් අන්දමින් සමරන ලදී. බොහෝ දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙය පවත්වනු ලැබූයේ ඩව්ටන් සීනියර් සිටිසන් ශාලාවේදීය. එදින ගරු බෝධිචිත්තා මෙහෙනින් වහන්සේ විශේෂ අමුත්තන් කිහිපදෙනෙකුටම ආරාධනා කර තිබූ අතර ගරු රුවන් පලාපත්වල පියතුමාගේ පැමිනීම කිව නොහැකි තරම් විශේෂ දෙයක් විය. පොසොන් පනිවිඩය උන්වහන්සේ විසින් ඉතා පැහැදිලිවත් සරලවත් දේශනා කරන ලදී. බෞද්ධ ධර්ම දේශනාවක් මෙතරම් නිවැරදිවත් පැහැදිලිවත් කතෝලික පියතුමකුගේ මුවින් අසන්නට ලැබෙනුයේ කොතරම් කලාතුරකින් ද....? නිවැරදි ධර්මය කාගෙන් කොතැනකදී ඇසුවත් ප්‍රශ්නයක් නැත. ගහකොලවලින් පවා අපට කියා දෙන්නේ ධර්මයයි. එය දේශනා කරන්නේ කවුරුන්ද යන්න විමසිලිමත් වනවාට වඩා අවශ්‍ය වන්නේ තමන්ගේ සවනින් එය අසා පුරුදු පුහුනු කිරීමයි. අපගේ ගරු බෝධිචිත්තා මෙහෙනින් වහන්සේගේ ගෞරවනීය ආරාධනය පිලිගෙන පැමිනි ගරු පලාපත්වල පියතුමා දේශනා කල ඒ ධර්මදේශනාවත්, ධර්ම සාකච්ඡාවත් පැමින සිටි සැමදෙනාටම දුන්නේ මහඟු ආදර්ශයකි. සෑම ආගමකම වෙනස්කම් දකිනවාට වඩා සමානකම් දැකීමට අපට දිරිගැන්වීමකි.

එදින මේ පොසොන් උත්සවය අලංකාර කල තවත් විචිත්‍රාංගයක් වූයේ දහම් පාසැල් දරු දැරියන්ගේ නැටුම් සංදර්ශනයක්, භක්ති ගීත ගායනාත්ය. අනෙක් විශේෂාංගය වූයේ බුදුන්වහන්සේගේ ජීවිත කතාව අලලා ඉදිරිපත් කල වාර්තාමය චිත්‍රපටියයි. මේ සෑම දෙයක්ම රසවිඳින අතර දෙමව්පියන් විසින් රාත්‍රී ආහාරය සඳහා ඉතා ප්‍රනීතව සකස් කල තිබූ ආප්ප සමග තිබූ නිර්මාංශ භෝජන පැමින සිටි හැම දෙනාගේම සතුටට හේතුවිය.

මෙයට අමතරව සල්පිලක්ද ඉතා පහසු මිලකට ටිකට්පතක් ද අලෙවි කරන ලදී. පින්කැමති බොහෝ දෙනෙකු මෙයට සහභාගි වූ අතර ඉන් ලැබුනු මුදල් සියල්ලම නිසල අරන භාවනා මධ්‍යස්ථානයේ ඉදිරි වැඩ කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට නියමිතයි. ඉතින් නිසල අරන භාවනා මධ්‍යස්ථානයේ වැඩ සිටින ගරු බෝධිචිත්තා මෙහෙනින් වහන්සේ කරගෙන යන්නා වූ මේ මහඟු සේවය සඳහා උන්වහන්සේට ධෛර්යය, ශක්තිය සහ නිරෝගීබව ලැබේවායි අප සැමදොනාම ප්‍රාර්ථනා කරමු. තෙරුවන් සරනයි !

වෙහෙසයි දිවිය සසරේ අප සැරිසරන
සසලයි සැමවිට ම සිත එහෙමෙහෙ දුවන
පැතිරෙයි බන දහම් දම් වැස්සක් ලෙසින
නිසලයි මේ අරන සිත සන්සුන් කරන

බුදු වැඩ සිටී බුදු කුටියේ උයන් කොනේ
සක්මන් මළුවෙ බට පදුරේ සිසිල දැනේ
බොධිචිත්තා මෙහෙනින්ගේ අමිල ගුනේ
කිසිදා නොවිඳි දම් සිසිලක් සිතට දැනේ
සිටියත් දුරු රටක ඈතින් මව් රටට
බැතිමල් පිපෙයි නිබඳව පෝදා සිතට
කෙලෙසුන් නසා විදසුන් දම් වැඩීමට
යන්නෙමි නිසල අරනට බන ඇසීමට

රශ්මි සුරංගිකා නෙත්තිකුමාර

# News from Sri Lankan Agric & Vet Association

Sri Lankan Agricultural & Veterinarian Association in Australia is in the process of updating its members' directory to be published in the annual get-together souvenir in 2009. Organizing committee invites new arrivals to contact Chinthana (Tel 0430013990) or Vimukthi (0433030382) and leave the contact details or e-mail to **infoslavgaa@optusnet.com.au.** Membership is open to any Sri Lankan origin person in the fields of Agriculture, Veterinary Science or Environmental Sciences or any individual who has a keen interest in one of these fields. Members are also invited to contribute to the souvenir by way of news and related articles in the above fields.

The Association decided to further its project initiated last year to promote Sri Lankan plants and herbs among the community. Collection of plants such as Karapincha (Curry Leaves), Mukunuwenna (Poonangani), Gotukola (Arthritis plant), Samanpichcha (Sri Lankan Jasmine) will be available in the evening on 26th September at "Ajani Centre – Templestowe" on which day the annual get-together is going to be held. Organizers invite interested individuals to participate this event by way of contributing plants or purchasing. Please contact Chinthana (0430013990) or Nilantha (0433277274) for further information.

## පුංචි කල්පන ට පිහිට වන්න



දොම්පේ කිඹුල්වල අංක 48/1 හි පදිංචි අවුරුදු 4ක් වයසැති කල්පන ශ්‍රී ආලෝක දරුවාට ඇසීමේ හැකියාව නොමැති බැවින් ලක්ෂ 28 ක මුදලක් වැය කර කර්ණ ශංඛ බද්ධය නමැති උපකරණයක් කණ තුළට බද්ධ කිරීමෙන් ඇසීමේ හැකියාව ලබාගත හැකි බව රාජගිරිය ගෝල්ඩන් කී රෝහලේ ENT වෛද්‍ය සෝහිත අබේරත්න මහතා නිර්දේශ කර ඇත.

මෙම මුදල රැස්කර ගැනීමට ඔබේ නොමසුරු ආදාරය කරුණාවෙන් අපේක්ෂා කරමු.

බොරැල්ල මහජන බැංකුවේ කහඳවල ආරච්චිගේ කල්පන ශ්‍රී ආලෝක නමින් අංක 320 - 2 - 001 - 8 - 0001537 වෛද්‍ය ආධාර ගිණුමට බැර කිරීමෙන් ඔබට හැකිය. මෙල්බන්හි මේ පිළිබඳව සහයෝගය දක්වන වෙළඳසල් කීපයකටද මෙම ආදාර මුදල් ලබා දිය හැකි ය.

වැඩි විස්තර http://kalpana.sripages.net වෙබ් අඩවිය මගින් හෝ දුරකතන අංක 03 9308 2279 මගින් හෝ ලබාගන්න.